ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව

රත්නපුර දිස්ත්‍රික්කය

---------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 16 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 23 දින ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 25 දින සභාවේ ලේකම්ට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

------ ------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බැලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත කරුණු නිරීක්ෂණ විය.

(අ) එකතුව රු. 85,420 ක් වූ හිඟ ජල ගාස්තු හා හිඟ බදු මුදල් පිළිබඳව සභාව විසින් පුද්ගලයන් දෙදෙනෙකුට එරෙහිව බලංගොඩ දිසා අධිකරණයේ පවරා තිබූ නඩු 02 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණය හිමි ලේඛනය අනුව රු. 11,741,024 ක් වූ වියදම් ණය හිමියෝ රු. 12,320,823 ක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට රු. 24,262,156 ක් වූ සම්මුච්චිත අරමුදල හා ඌනතා ගිණුමේ ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි රු. 24,339,791 ක් ලෙස දක්වා තිබුණි.

(ඈ) "පිළිසරු" ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන මගින් සභාවේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ලබාදුන් රු. 300,000 ක් වූ "සීවර්" යන්ත්‍රයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ නිවාස ණය පොලී වල රජයේ දායකය වූ රු. 96,984 ක් වර්ෂයේ ආදායමක් හා වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ නිර්දේශ අනුව ඉවත් කරන ලද රු. 9,546 ක් වූ පුස්තකාල පොත් ගිණුම් වලින් ගලපා නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළ පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු වටිනාකම රු. 39,998 ක් වූ පුස්තකාල පොත් 138 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ සභාවේ ඉදිකිරීම් හා වැඩිදියුණු කිරීම් සඳහා දරන ලද රු. 1,431,938 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(එ) විවිධ තැන්පතු ලේඛනයේ කේවල ශේෂ වල එකතුව වු රු. 1,918,562 ක්, විවිධ තැන්පතු පාලන ගිණුමේ රු. 7,282,139 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඒ) අත්තිකාරම් ලේඛනයේ ශේෂයන්ගේ එකතුව වු රු. 8,148,962 අත්තිකාරම් පාලන ගිණුමේ රු. 6,976,819 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඔ) සේවක ණය පාලන ගිණුම හා සේවක ණය ලේඛනයේ කේවල ණය ශේෂයන්ගේ එකතුව අතර වු රු. 77,691 ක වෙනස සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

1.3.2. ලැබිය යුතු ගිණුම්
-------------------

පහත කරුණු නිරීක්ෂණය විය

(අ) 2016 දෙසැම්බර් 31 දිනට අයකර ගතයුතු අක්කර බදු රු. 78,200 ක් 2017 ජූලි වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය හා ඊට පෙර වර්ෂ සඳහා භිහ ජල ගාස්තු රු. 2,911,034 කින් රු. 2,110,750 ක් හෙවත් සියයට 73 ක් 2017 ජූලි වනවිටත් අයකර ගෙන නොතිබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම
------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ස්ථාවර වත්කම් විෂයයන් 04 ක් සනාථ කර ගැනීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනය , විස්තරාත්මක උපලේඛන හා අනෙකුත් ගිණුම් විෂයයන් 02 ක් සනාථ කර ගැනීම සඳහා කාල විශ්ලේෂණ වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.3.4. නිතී, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය.

| නිතී, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු.රෙ 141(2) | එකතුව රු. 377,588 ක් වු ගෙවීම් අවස්ථා 10 කදී චෙක්පත් උප පත්‍රිකා වල කෙටි අත්සන් තැබිමට කටයුතු කර නොතිබුණි. |
| (ii) මු.රෙ 371(5) | 2002 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා නිකුත් කරන ලද එකතුව රු. 8,148,962 ක් වු අතුරු අග්‍රිම 128 ක් 2017 ජූලි වන විටත් පියවා නොතිබුණි. |
| (iii) මු.රෙ 395(ඇ) | සභාවේ පරිසර ජංගම ගිණුම සම්බන්ධයෙන් 2001 වර්ෂයේ සිට බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. |
| (iv) මු.රෙ 571 | 2016 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ පැවති රු. 7,282,139 ක් සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම ලැයිස්තු පිළියෙල කර හිමිකම් නොපාන ලද ‘‘ඉකුත් වු’’ තැන්පතු නියාදනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීතීය | |
| (i) 96 රීතිය | එකතුව රු. 175,000 ක් වු අත්තිකාරම් 03 ක් පියවීමේදී වවුචර් පිළියෙල කර නොතිබුණි. |
| (ii) 185 රීතිය | සභාව විසින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමක 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා සෑම මසකම රු. 1,000,000 කට වැඩි ශේෂයක් තිබුණද, එම මුදල් ස්ථිර තැන්පතුවල ආයෝජනය කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 1975 පළාත් පාලන විශ්‍රාම වැටුප් නියෝගයේ 36 වගන්තිය | 1993 සැප්තැම්බර් 03 දිනට පෙර විශ්‍රාම ලැබූ පළාත් පාලන සේවයේ විශ්‍රාමික නිළධාරීන් වෙත විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා සභාව විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් එකතුව රු. 160,708 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 හා 3.2 ඡේදය | කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමේ දී පිළිපැදිය යුතු අවශ්‍යතා අනුගමනය නොකර ඇස්තමේන්තු වැඩ වටිනාකම රු. 9,213,049 ක් වූ කොන්ත්‍රාත් 20 ක් පිරිනමා තිබුණි. |
| (ඉ) | 2015 ජුලි 15 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2013 ජුනි 05 දිනැති අංක PCMO/PR/2013 දරන ජනාධිපති ලේකම්වරයාගේ ලිපිය | ගර්හිත තත්ත්වයේ පවතින වර්ගයේ යතුරුපැදියක් සහ කැබ් රථයක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

   ------------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

   --------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 8,811,194 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 9,615,154 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 803,960 ක පහත වැටීමක් දක්නට ලැබුණි.

2.2 **ආදායම් පරිපාලනය**

   ----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වරිපනම්

   ----------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ සඳහා හිඟව තිබූ වරිපනම් ගාස්තු රු. 37,540 ක් 2017 ජුලි වනවිටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) මුද්දර ගාස්තු

--------------

2015 ජනවාරි සිට 2016 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාළව ලැබියයුතු මුද්දර ගාස්තු හඳුනාගෙන පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් අයකර ගැනිමට 2017 ජුලි වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) උසාවි දඩ මුදල්

-----------------

2016 මැයි සිට දෙසැම්බර් දක්වා අයවිය යුතු රු. 490,325 ක් වූ උසාවි දඩ මුදල් පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් අයකර ගැනීමට 2017 ජූලි වන විටත් කටයුතු කර නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

3.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

කාර්යමණ්ඩලය 49 දෙදෙනෙකුගෙන් සමන්විත සභාවේ නිළධාරීන්ගේ පැමිණීම සහ පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍රයක් 2015 වර්ෂයේ සිට භාවිතා කළද, සභාවේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ලෙස එය යොදා ගෙන නොතිබුණි.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 පෙබරවාරි මස නිමකර තිබූ කැපොක්වත්ත කසළ කළමනාකරණ පරිශ්‍රයේ ඇති කොන්ක්‍රීට් මාර්ග තලයේ දිග මීටර් 7.7 ක් සහ පළල මීටර් 1.5 ක් වූ කොටසක් කැඩී මාර්ගයෙන් පිටතට තල්ලු වී තිබුණද, එය පිළිසකර කිරීමට 2017 ජූලි වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ආ) රත්මලවින්න බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු. 980,000 ක කොන්ත්‍රාත් වටිනාකමකට 2014 සැප්තැම්බර් 11 දින ගිවිසුම් අත්සන් කර තිබුණු අතර ගොඩනැගිල්ලෙහි අත්තිවාරම සහ කොන්ක්‍රීට් කණු 21 ක් ඉදිකිරීම වෙනුවෙන් රු. 255,045 ක් ගෙවීමෙන් පසු 2014 දෙසැම්බර් සිට ඉදිකිරීම් නවතා තිබුණි. එම පරිශ්‍රය වල් බිහි වී තිබීම සහ කොන්ක්‍රීට් කණුවල ඉහලට ඇති කම්බි මල බැඳී තිබීම නිසා එම වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

රු. 3,450,000 ක් වටිනාකම වූ සභාවට අයත් වාහන 02 ක් වර්ෂ දෙකේ සිට වර්ෂ හතර දක්වා කාලපරිච්ඡේදයක සිට නිෂ්කාර්යව පැවතුණි.

3.4 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රාජ්‍ය කළමනාකරණ සහකාර අධිශ්‍රේණියේ ලේකම් තනතුර පුරප්පාඩු වී තිබුණු අතර රාජ්‍ය කළමනාකරණ I ශ්‍රේණියේ නිලධාරියකු 2014 වර්ෂයේ මැයි සිට ලේකම් තනතුරේ වැඩ බැලීමට පත්කර තිබුණි.

(ආ) ආදායම් පරීක්ෂක තනතුරු 02 ක්, ආයුර්වේද ඖෂධ සංයෝජක, සෞඛ්‍ය කම්කරු තනතුරු 02 ක්, පුස්තකාලාධිපති, සංවර්ධන නිළධාරී යන තනතුරුවල පවතින පුරප්පාඩු 08 ක් පිරවීමට කටයුතු කර නොතිබීමෙන් අදාල කාර්යය සහ කර්තව්‍යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරිමට බාධා වී තිබුණි.

3.5 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

--------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට වාර්ෂිකව එකතුවන අපද්‍රව්‍ය වලින් ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි අපද්‍රව්‍ය දළ වශයෙන් ටොන් 90 ක් පමණ පරිසරයට අහිතකර නොවන පරිදි බැහැර කිරීමට ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු නොකර බිම් පිරවුම වෙත බැහැර කර ගිනි තැබීම සිදු කර තිබුණි.

(ආ) මධ්‍යම පරිසර අධිකාරියෙහි "පිළිසරු" ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ ආධාර මත රු. 8,864,327 ක් වැය කර "රයි කැපොක්වත්ත" නැමති ස්ථානයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකර 2016 පෙබරවාරි මස වැඩ අවසන් කර තිබුණද, මෙම මධ්‍යස්ථානයට වාර්ෂිකව එකතුවන දිරන අපද්‍රව්‍ය ටොන් 720 ක් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොදා ගැනිමට ක්‍රමවේදයක් 2017 ජූනි වන විටත් සකස්කර නොතිබීමෙන් ව්‍යාපෘතියේ අරමුණ ඉටුවී නොතිබුණි.

## 04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය තුල සභාවේ පුනරාවර්තන වියදම් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු. මිලියන 46.51 ක් වූ අතර එහි තත්‍ය වියදම රු. මිලියන 32.33 ක් වීමෙන් ප්‍රතිපාදන වලින් රු. මිලියන 14.18 ක් හෙවත් සියයට 30 ක් උපයෝජනය කර නොතිබුණි. ප්‍රාග්ධන වියදම් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන රු. මිලියන 1.77 ක් වූ අතර එහි තත්‍ය වියදම රු. මිලියන 6.37 විමෙන් ප්‍රතිපාදන ඉක්මවා රු. මිලියන 4.60 ක් හෙවත් සියයට 260 ක් වැය කර තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය තුළදී සභාව සතු යන්ත්‍ර කුලියට දීමෙන් රු. 50,000 ක ආදායමක් ඇස්තමේන්තු ගත කර තිබුණද, එයින් කිසිදු ආදායමක් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස අයවැය ලේඛනය යොදවා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලනයන්

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) ගිණුම්කරණය | (i) | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම. |
| | (ii) | ආදායම්, වියදම් හා වත්කම්, බැරකම් අඩුවෙන් හා වැඩියෙන් ගිණුම්ගත කිරීම |
| (ආ) අයවැය පාලනය | (i) | වැය ප්‍රතිපාදනවල සැලකිය යුතු ඉතිරිවීම් තිබීම |
| | (ii) | ඇස්තමේන්තුගත ආදායම් අය කර නොගැනීම |
| | (iii) | පරිපූරක ඇස්තමේන්තු පිළියෙල නොකිරීම |
| (ඇ) ආදායම් පරිපාලනය | | හිඟ ආදායම් අය කර නොගැනීම |
| (ඈ) වාහන පාලනය | | වාහන නිෂ්කාර්යව පැවතීම |
| (ඉ) මානව සම්පත් කළමනාකරණය | | පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම |
| (ඊ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | (i) | ක්‍රමාණුකූලව අපද්‍රව්‍ය බැහැර නොකිරීම |
| | (ii) | ඝන අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයේ අරමුණු ඉටුනොවීම |
| (එ) කොන්ත්‍රාත් පරිපාලනය | (i) | සැලසුම අනුව වැඩ අවසන් නොකිරීම |
| | (ii) | ඉදිකිරීම් නිසි පරිදි නඩත්තු නොකිරීම |